චක්‍රලේඛ අංක : 35/01/005/0010/21 2018 සැප්තැම්බර් 29

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත**

## මෝටර්රථ වාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වන ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතාව

2018 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මෙයින් දැනුම්දෙනු ලබයි.

1. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් "අ" ලේඛනයෙහි (අමුණා ඇත) සඳහන් කොට ඇති මෝටර්රථ වාහන හැර අනෙකුත් මෝටර්රථ වාහන ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී, එම අයිතමයන්වල ආනයන වටිනාකමින් සියයට දෙසීයක් ආවරණය වන පරිදි අවම මුදල් ආන්තිකයක්, ණයවර ලිපි විවෘත කරන බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි තැන්පත්කර නොමැති අවස්ථාවකදී ණයවර ලිපි විවෘත නොකළ යුතුය.
2. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් "ආ" ලේඛනයෙහි (අමුණා ඇත) සඳහන් කොට ඇති අයිතමයන් හැර අනෙකුත් අයිතමයන් ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී, එම අයිතමයන්වල ආනයන වටිනාකමින් සියයට සියයක් ආවරණය වන පරිදි අවම මුදල් ආන්තිකයක් ණයවර ලිපි විවෘත කරන බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි තැන්පත්කර නොමැති අවස්ථාවක දී ණයවර ලිපි විවෘත නොකළ යුතුය.

   මෙම චක්‍රලේඛය යටතේ ආවරණය වන අයිතමයන් සඳහා පහත සඳහන් කොන්දේසි අදාළ වේ.
3. ඉහත 1 සහ 2 ඡේදයන්හි සඳහන් කොන්දේසිවලට පරිබාහිරව, ඉහත සඳහන් අයිතමයන් ආනයනය සඳහා දැනටමත් විවෘත කර ඇති ණයවර ලිපිවල වටිනාකම වැඩි කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු අවසර නොදිය යුතුය.
4. මෙම චක්‍රලේඛය මගින් පනවා ඇති අවම ආන්තික තැන්පතු අවශ්‍යතාව සපුරා ගැනීමට හැකිවන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ආනයන ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් ලබා නොදිය යුතුය.
5. බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් මෙම චක්‍රලේඛයන්ට අනුකූලව ආන්තික තැන්පතු ලබාගෙන ඇති බවට, අදාළ ඉන්වොයිසිය මත පිටසන් කළ යුතුය.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නැවත දන්වන තුරු මෙම නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. මෝටර්රථ වාහන ආනයනය සඳහා ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතා පිළිබඳ නිකුත් කරන ලද අංක 35/01/005/0010/20 දරන චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

සී. ඒ අබේසිංහ
**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

මෙම විධානයේ උපලේඛන 'අ' සහ 'ආ' https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/DOD_Circular_No_35_01_005_0010_21_e.pdf ඔස්සේ ලබා ගත හැක.